
# 03 අනුත්තර පින් කෙතය සඟ ගණ



බෞද්ධයින් වන අප පූජනීයත්වයෙන් සලකා වැඳුම් පිදුම් කරන උතුම් රත්න තුනක් ඇත. බුද්ධ, ධම්ම, සංඝ යනු එම රත්න තුනයි. මෙම රත්න තුනෙන් සංඝ රත්නය ලොවට දායාද වන්නේ සම්බුද්ධත්වයට පත් ව දෙමාසයකින් එළඹි ඇසළ පොහෝ දින ය. එදා පස්වග මහණුන්ගෙන් ආරම්භ වුණු සඟරුවන මේ වන විට වසර දෙදහස් හයසිය ගණනක ඉතිහාසයකට උරුමකම් කියයි. සංඝ සමාජය යනුවෙන් හැඳින්වෙන්නේ මෙසේ ලොවට

බිහි වූ මහා සංඝ රත්නයයි. මහා සංඝ රත්නය සතු උදාර වූ ගුණ සමුදායත් සිදු කරනු ලබන උතුම් ආගමික, අධ්‍යාපන හා සමාජ මෙහෙවරත් නිසා උන් වහන්සේලා ලෝකවාසී සියලු බෞද්ධයිනට ම මහාර්ඝ වූ සම්පතකි. සඟරුවනේ සුවිශේෂී වූ ගුණ නමයක් දහමෙහි සඳහන් වේ.

## 1. සුපටිපන්න

මහ සඟරුවන මනා පිළිවෙත් ඇති බැවින් සුපටිපන්න වන සේක. එම පිළිවෙත නම් නිර්වාණ මාර්ගයයි. එනම් රාග, ද්වේශ, මෝහ නැති කරන මාර්ගයයි. සංඝ රත්නයට අයත් ඇතැම් උතුමෝ නිවන පසක් කළෝ ය. සෙසු පිරිස එම මාර්ගයේ ගමන් කරති. එබැවින් මේ සියලු මහා සංඝ රත්නය සුපටිපන්න ගුණයෙන් යුක්ත ය.

**මුනිඳු දෙසූ විලසින**
**මහගු පිළිවෙත් සුරකින**
**අරිය අට සඟ ගුණ**
**සුපටිපන්නය කියා පැවසිණ**

## 2. උජුපටිපන්න

අධි ශීල, අධි චිත්ත, අධි ප්‍රඥාවෙන් යුක්ත ව සෘජු ප්‍රතිපත්තියෙහි යෙදෙන බැවින් සංඝ රත්නය උජුපටිපන්න නම් වන සේක. එහි අදහස සෘජු, ඇද නැති ආර්ය ප්‍රතිපදාවට අනුව උන් වහන්සේලා කටයුතු කරන බවයි. ශරීරයට අධික සැප සම්පත් ලබා දෙන කාමසුඛල්ලිකානුයෝගය හා ශරීරයට අධික දුක් දෙන අත්තකිලමථානුයෝගය යන අන්තවලින් මිදී මධ්‍යම ප්‍රතිපදාව අනුව උන් වහන්සේලා කටයුතු කරන සේක. ඒ අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වූ එම සෘජු හෙවත් අවංක පිළිවෙත අනුගමනය කරන නිසා උන් වහන්සේලා උජුපටිපන්න ගුණයෙන් යුක්ත ය.

**නොවක් ලෙස සොඳිනා**
**මැදුම් පිළිවෙත පුරනා**
**බැවින් සඟ රුවනා**
**යුතුයි උජුපටිපන්න ගුණෙනා**

## 3. ඤායපටිපන්න

ඤාය යනු නිවන් මගට නමකි. බුදු දහමට අනුව නිවන් අරමුණු කරගත් ශ්‍රාවකයා දුක්ඛ නිරෝධගාමිනි පටිපදා මාර්ගයේ ගමන් කළ යුතු ය. එය ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

මහ සඟරුවන, එම ආර්ය මාර්ගයෙහි ගමන් කරන උතුමන් පිරිසකි. එසේ නිවන් සාදා දෙන පිළිවෙත් දරන බැවින් උන් වහන්සේලා ඤායපටිපන්න ගුණයෙන් යුක්ත වන සේක.

**සඟ මැදට එන්නෝ**
**අරි අටඟි මඟ යන්නෝ**
**ඤාය පටි පන්නෝ**
**කියා එබැවින් හැඳින් වෙන්නෝ**

## 4. සාමීචිපටිපන්න

සඟරුවන අනුගමනය කරන නිර්වාණගාමී මැදුම් පිළිවෙත ගරු බුහුමනට ලක් විය යුත්තකි. එබඳු ගරු බුහුමන් ලැබීමට සුදුසු ආර්ය ප්‍රතිපදාවක් පුරන හෙයින් මහ සඟරුවන සාමීචිපටිපන්න ගුණයෙන් යුක්ත ය. දුටු විට හුනස්නෙන් නැගිටීම, ආසන පැනවීම, පවන් සැලීම, පා ධෝවනය, මුව දෙවීම හා ස්නානය සඳහා පැන් පහසුකම් සලසා දීම, සිවුරු සෝදා දීම, සේනාසන පවිත්‍ර කර දීම ආදී ඇප උපස්ථාන ලැබීමට උන් වහන්සේලා සුදුසු ය. ඒවා සාමීචි කර්ම යනුවෙන් ද හැඳින්වේ.

**පුදමින් සිවු පසය**
**උවටැන්වලට සුදුසුය**
**එබැවින් සඟ ගණය**
**කියති සාමීචි පටි පන්නය**

## 5. ආහුනෙය්‍ය

සැදැහැවතුන් ඉතා දුර බැහැර සිට වෙහෙස මහන්සි වී ශ්‍රද්ධාවෙන් රැගෙන එන සිවුපසය පිළිගැන්වීමට සුදුසු වන නිසා භික්ෂූන් වහන්සේලා ආහුනෙය්‍ය ගුණයෙන් යුක්ත ය. උන් වහන්සේලා සතු ව පවත්නා සිල්වත්බව ඊට හේතුවයි. එසේ සිවුපසය පිළිගන්වන සැදැහැවතුනට බොහෝ අනුසස් ලැබේ.

**දුර සිට රැගෙන එන**
**දෙයකින් වුව ද සැදැහෙන**
**පිදුමට නිසි බැවින**
**ආහුනෙය්‍යයි අරිය සඟ ගණ**

## 6. පාහුනෙය්‍ය

පාහුනෙය්‍ය යනුවෙන් හැඳින්වෙන්නේ ඥාති හිතමිත්‍රාදීන් සඳහා පිළියෙල වන සංග්‍රහයට ය. එවැනි සංග්‍රහයක් වෙනත් කිසිවකුට සිදු කරනු නොලැබේ. එසේ ආගන්තුක සංග්‍රහයක් වුව ද පිළිගැන්වීමට සුදුසු වන නිසා උන් වහන්සේලා පාහුනෙය්‍ය ගුණයෙන් යුක්ත වන සේක.

| | |
|---|---|
| පළමුව අන් | සැමට |
| නිසි වන බැවින් | පිදුමට |
| මහ සඟරුවන | සෙට |
| පාහුනෙය්‍යයි අනුව | දහමට |

## 7. දක්ඛිණෙය්‍ය

මෙලොව පරලොව සැපත පිණිස පිළිගන්වනු ලබන සියලු දාන පිළිගැනීමට සුදුසු වීම දක්ඛිණෙය්‍ය නම් වේ. දන් දීමෙන් අපේක්ෂා කරන ආනිශංස උපරිම වශයෙන් ලැබීමට නම් සුදුසු පුද්ගලයින්ට ම පිළිගැන්විය යුතු ය. ඒ අනුව දන් පිළිගැන්වීමට වඩාත් ම සුදුසු වන්නේ මහ සඟරුවනයි. එනිසා උන් වහන්සේලා දක්ඛිණෙය්‍ය ගුණයෙන් යුක්ත ය. දායක පක්ෂයට දෙව් මිනිස් සැප ලැබෙන්නේ එවැනි පිරිසකට දන් පිළිගැන්වීමෙනි. ශීල, සමාධි, ප්‍රඥා ආදි පිළිවෙත් සම්පූර්ණ කළ හා එසේ කිරීමට වෙර දරන පිරිසක් වශයෙන් සංඝ රත්නය දක්ෂිණාව පිළිගැන්වීමට හැම අතින් ම සුදුසු උතුමන් වේ.

| | |
|---|---|
| උතුම් සැප ලැබ | දෙන |
| දනක් දීමට නිසි | වන |
| බැවින් මහ සඟ | ගණ |
| දක්ඛිණෙය්‍යයි කියා | පැවසිණ |

## 8. අඤ්ජලිකරණීය

ඇඳිලි බැඳ දොහොත් නගා වැඳීමට සුදුසු වීම අඤ්ජලිකරණීය නම් වෙයි. ලෝකයා විසින් දොහොත් මුදුන් දී සිදු කරනු ලබන වන්දනාමානවලට සුදුසු බැවින් මහ සඟරුවන අඤ්ජලිකරණීය ගුණයෙන් යුක්ත වන සේක. උන් වහන්සේලා උතුම් ශීලාදි ගුණයන්ගෙන් යුක්ත වීම ඊට හේතුවයි. අප සඟරුවනට වඳිනුයේ බියෙන් හෝ ලාභ අපේක්ෂාවකින් හෝ නොවේ. සැදැහැ සිත පෙරදැරි කොටගෙන ය. අඤ්ජලිකරණීය ගුණයෙන් යුක්ත වන මහ සඟරුවනට දිව්‍ය, බ්‍රහ්මාදීහු පවා වන්දනය කරති.

| | |
|---|---|
| ඇඳිලි බැඳ | මැනැවින් |
| පිදුමට නිසිය | සැබැවින් |
| සඟරුවන | එබැවින් |
| යුතුයි අඤ්ජලිකරණී | ගුණයෙන් |

### 9. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස

ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවෙන් පිරිපුන් මහ සඟරුවනට සිවුපසයෙන් උවටැන් කිරීම මහානිශංසදායී පින්කමකි. සාරවත් වූ කුඹුරකින් ලැබෙන අස්වැන්න මෙන් සැදැහැවතුන්ට පින් නමැති අස්වැන්න නෙළා ගැනීමට භික්ෂූන් වහන්සේලා උතුම් වූ කුඹුරකි. ඒ අනුව මහා සංඝ රත්නය අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත නම් ගුණයෙන් යුක්ත ය.

| | |
|---|---|
| ලොව සැදැහැ ඇති | දන |
| පින නම් බීජ | වපුරන |
| සරු කෙත වන | බැවින |
| අනුත්තර පින් කෙත ය සඟ | ගුණ |

**සාරාංශය**

ත්‍රිවිධ රත්නයෙහි තුන්වැනි රත්නය මහ සංඝ රත්නයයි. මහ සඟරුවන සතු ව ශීලාදි ගුණ ධර්ම රැසක් ඇත. එම ගුණාංග සාරාංශ කොට දක්වා ඇති පාඨය සුපටිපන්නෝ යනුවෙන් ආරම්භ වේ. සෝවන් ආදී මාර්ගඵලලාභී ආර්ය මහා සංඝ රත්නයේ ගුණ අසීමිත ය. ඒ සියල්ල ගුණ නවයක් ලෙස සංග්‍රහ කොට තිබේ.

## ක්‍රියාකාරකම

1. සුපටිපන්නෝ පාඨය නිවැරැදි ව සජ්ඣායනා කරන්න.

2. එම පාඨයෙහි ඇති සඟ ගුණ නවය නම් කොට සිංහල තේරුම දක්වන්න.

3. සංඝ රත්නය වෙනුවෙන් ගිහියන් විසින් ඉටු කළ යුතු යුතුකම් පෙන්වා දෙන්න.

## පැවරුම

- ආසන්න රෝහලක රෝගීව වැඩ සිටින භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කිරීමට සුදුසු වැඩපිළිවෙළක් ගුරු දෙගුරුන්ගේ උපදෙස් පරිදි සංවිධානය කරන්න.

## පුහුණුවට

සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා
සැරියුත් මහ මුගලන් පිළිවෙළිනා
පිළිවෙත් සරු මහ සඟගණ සොබනා
මුදුනත් බැඳ නමදිමි බැති පෙමිනා

(ලෝවැඩ සඟරාව)